**අධිකරණ අමාත්‍යාංශය**

**සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක ප්‍රවේශක තනතුරු සඳහා පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය- 2020**

1.0 2016.07.26 දිනැති PSC/EST/06-01-32/01/2016 මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද බඳවා ගැනීමේ පටිපාටියේ 08 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 පෙබරවාරි මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක ප්‍රවේශක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

3.0 සුදුසුකම් - සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක ප්‍රවේශක III ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයකු වීම.

4.0 අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් දෙපාර්තුමේන්තු ප්‍රධානියා මගින් 2021.11.15 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස්, තැ.පෙ 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම් පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

5.0 විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය .

6.0 (I) අයදුම්පත්- ආදර්ශ අයදුම්පතේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේද පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි “ඒ4” ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත පිළියෙල කළ යුතුය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය.අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද සම්පූර්ණ කරනු ලබන විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

( II ) ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(III) පළමුවන වරට මෙම විභාගයට අයදුම්කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු 600ක මුදලක් විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම්ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ අදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

7.0 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපත හා ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ඵලදායි වනු ඇත.

**සටහන -** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු /ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

8.0 අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

9.0 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලද ප්‍රවේශ පත්‍ර ලැබූ නිලධාරීන්ට විභාගයට පෙනි සිටීමට හැකි වන පරිදි දෙපාර්තුමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 මෙම විභාගය සිංහල හා දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් පැවැත්වේ. නිලධාරින්ට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගය සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 සාමර්ථ්‍යය සඳහා විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ක් ලබා ගත යුතුවේ. ( වැඩි විස්තර සඳහා සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක සඳහා වන බඳවා ගැනිමේ පටිපාටියේ 8 ඡේදය බලන්න.)

13.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කර ගත යුතු අතර ඒවා එම භාෂාවෙන්ම පිරවිය යුතුය.

14.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තුමේන්තුව මගින් අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් අයදුම්කරුවන්ගේ නම් අධිකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

15.0 විභාග පටිපාටිය - අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයන් ඇතුළත් බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

| විෂයය | ලකුණු | කාලය | විෂය අංකය |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා ගිණුම් ක්‍රම | 100 යි | පැය 01 යි | 01 |

15.1 කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය හා ගිණුම් ක්‍රම

කාර්යාල ක්‍රමවල වැදගත්කම, කාර්යාල ක්‍රම පිළිබඳ මූල ධර්ම, ලැබෙන ලියුම් හා පිටතට යැවෙන ලියුම් පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග, ලිපි ගොනුවල සටහන් ලිවීම, වාර්තා ලිවීම, මහජනයා සමග කටයුතු කිරීම පිළිබඳ අවබෝධය

ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ පරිච්ඡේද අංක XII, XXIV

මුදල් රෙගුලාසි සංග්‍රහයේ III පරිච්ඡේදය - මු.රෙ 124 - 127

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැලකිය යුතුය. තව ද මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ලේකම්, අධිකරණ අමාත්‍යාංශය විසින් තීරණය කරනු ඇත.

ලේකම්,අධිකරණ අමාත්‍යාංශය

2021 ( ඔක්තෝම්බර් ) මස (12 ) දින

අධිකරණ අමාත්‍යාංශය,

උපරිමාධිකරණ සංකීර්ණය,

කොළඹ 12.

**ආදර්ශ අයදුම්පත**

සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා / අධිකරණ සෝෂක ප්‍රවේශක තනතුරු සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2020(2021)

First Efficiency Bar Examination of Process Server and Writ Executor / Court Crier – 2020(2021)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය -

සිංහල -2

දෙමළ -3

ඉංග්‍රීසි -4

(අදාළ කොටුව තුළ ලියන්න.)

---

1.0 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ………………………
(උදා - HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .....
(උදා GUNAWARDHANA, H.M.S.K)

1.3 සම්පූර්ණ නම ( සිංහලෙන්/ දෙමළෙන්) : ………………………

2.0 සේවා ස්ථානය හා ලිපිනය

2.1 කාර්යාලයේ/දෙපාර්තුමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .....

2.2 කාර්යාලයේ/දෙපාර්තුමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය ( සිංහලෙන්/ දෙමළෙන්) :......

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ……….......

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී - 1

(අදාළ කොටුව තුළ ලියන්න.) පුරුෂ - 0

4.0 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5.0 දුරකථන අංකය - ජංගම :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ස්ථාවර:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

6.2 පත්වීම් දිනය : ……………

7.0 7.1 ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට ද? : ……………

7.2 විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව: ……

7.3 තැපැල්/ උප තැපැල් හෝ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: …………

7.4 ලදුපත් අංකය : ……………

7.5 දිනය : ……………

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
| (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

8.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීම හිමිකම් ඇති බවත්, මා විභාගයට අයදුම් කරන්නේ .......... වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / රුපියල් ................ ක විභාග ගාස්තුව ........... තැපැල්/ උප තැපැල් හෝ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට......... දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය - ...........                                        ...........................

අයදුම්කරුගේ අත්සන

සටහන - තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

## අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන................. මහතා/ මහත්මිය/මෙනවිය ................. වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, ඔහු ඇය විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත් / නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

...............................

සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව

නම -..................

පදවිය - ...............

ලිපිනය - ............

දිනය - ...............

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසිටි බවත්,
3. නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීම සුදුසු බවත්,

මම සහතික කරමි.

*අනවශ්‍ය වචන කපා හරින්න.

නම -..................

පදවිය - ...............

..............................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ලිපිනය - ............

දිනය - ................